# බාදරායණ විසින් ඛණ්ඩනය කරන ලද බෞද්ධ ක්ෂණවාදය පිළිබඳ විමසුමක්

පැපිලියවල නාරද හිමි[1]

## හැඳින්වීම

ක්‍රිස්තු පූර්ව හය වන සියවසෙහි භාරතයේ පහළ වූ බුදුරදුන් සත්ත්වයන්ගේ සමස්ත ආධ්‍යාත්මය වෙළා පවතින දුකත් සත්ත්වයන් එම දුකින් ඔවුන් මුදවා ගැනීමත් පරමාර්ථ කොට ගෙන ධර්මය දේශනා කළ ශාස්තෘවරයෙකි. බුදුරදුන් සිය මංගල ධර්ම දේශනාව වූ ධම්මචක්කපවත්තන සූත්‍රයේ දී පුද්ගලයා සසරෙහි ප්‍රවෘත්ත වීමට හේතුවත් ඉන් ඔහු දුකට පත් වන ආකාරයත් එයින් මිදීමත් ඒ සඳහා වන මාර්ගයත් පෙන්වා දෙන ලදී. ඒ මාර්ගය අනුව ගමන් කරන කවරෙකුට වුවද මෙම භව දුක්ඛයෙන් නිදහස් විය හැකිය. බුදුරදුන් දුක්ඛ සංකල්පය අට ආකාරයකින් විග්‍රහ කරනු ලබන අතර එහිලා දැක්වෙන ජාතිදුක්ඛය, ජරාදුක්ඛය හා මරණදුක්ඛය පශ්චාත් කාලීනව බෞද්ධ සම්ප්‍රදායන්හි පහළ වූ ක්ෂණවාදය සඳහා න්‍යායාත්මක පසුබිමක් සපයන ලද බව පෙනේ.

සියලු ම සංස්කාර ධර්ම අනිත්‍ය හා අනාත්ම බවත් ඒවා එසේ අනිත්‍ය හා අනාත්ම වන බව නුවණින් දුටුවොත් දුකෙහි කලකිරී විසුද්ධිය ලබන බවත් බුදුසමයෙහි අවධාරණය වෙයි. බුදුරදුන්ගේ මංගල ධර්ම දේශනාවසානයේ දැක්වෙන්නේ ද යමක් හටගන්නේ නම් ඒ සියල්ල නැති වන බව යි. එනම්, සියලු ම උපදින ධර්මයන් නිරුද්ධ වන බව පැවසීමෙන් පෙනෙන්නේ අනිත්‍ය නො වන කිසිදු දෙයක් නො පවතින බව හෙවත් ලොව පවත්නා නාම රූප ධර්ම සියල්ල ප්‍රවාහයක් බඳුව නිතර වෙනස් වෙමින් පවත්නා බව යි. මුල් බුදුසමයේ පැණෙන මෙම අනිත්‍යතාවය සංවර්ධිත බුදුසමය වන විට පරිපූර්ණ ක්ෂණවාදයක් දක්වා දියුණු වූ බව පැහැදිලි වෙයි.

මුල් බුදුසමයේ පවා භෞතික ධර්මයන්ගේ (සියල්ල) අනිත්‍යතාව ප්‍රකාශ වන අතර අභෞතික ධර්මයන්ගේ ලක්ෂණයක් ලෙස ක්ෂණවාදය දක්වා තිබේ. සංයුත්ත නිකායේ, 'අශ්‍රැතවත් පෘථග්ජනයා මේ චාතුම්මහාභූතික ශරීරය ස්වකීය ආත්මය වශයෙන් සැලකීම උතුම් ය. එහෙත් සිත එලෙස ගැනීම නො මැනවි. ශරීරය එක් වර්ෂයක්, දෙවර්ෂයක්, තෙවර්ෂයක් .... ජීවත් වුවද පෙනෙන දෙයක් වෙයි. එහෙත් යමෙක් මේ සිත යැයි මනස යැයි විඤ්ඤාණය යැයි කියනු ලැබේ ද ඒ සිත රෑ ද දහවල් ද අනෙකක් ම උපදී. අනෙකක් ම නිරුද්ධ වෙයි.' මේ පාඨයෙන් ගම්‍ය වන්නේ අභෞතික ධර්මයන්ගේ ක්ෂණිකත්වය යි. සිත හා සිතේ

[1] බෞද්ධ අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය

සම්ප්‍රයුක්ත ධර්මයන් මේ ගණයට වැටෙයි. සිත පමණ ඉතා ලුහුඬු වෙනස් වීමකට භාජනය වන වෙනත් කිසිදු ධර්මයක් නොමැති බව මුල් බුදුසමයේ ස්ථාවරය යි. අභෞතිකයට පමණක් සීමා වූ මෙම ක්‍ෂණ භංගුරත්වය පශ්චාත් කාලීන ව බෞද්ධ සම්ප්‍රදායන් විසින් අභෞතිකයට මෙන් ම භෞතික ධර්මයන්ගේ ක්‍ෂණිකත්වය දක්වා ම සංවර්ධනය කරනු ලබයි. පරමත්ථජෝතිකාවේ දී 'ස්කන්ධයන් උපදිත්ම, දිරත්ම, මැරෙත්ම ක්‍ෂණයක් පාසා ඔබ උපදින්නෙහිය, දිරන්නෙහිය, මැරෙන්නෙහිය.' යනුවෙන් සඳහන් වීමෙන් ඒ බව මනා ව පැහැදිලි වෙයි.

මේ සම්බන්ධයෙන් තවදුරටත් විග්‍රහයක යෙදෙන අංගුත්තර නිකාය, සෑම සංඛත ධර්මයක් ම (භෞතික හා අභෞතික) උප්පාද, වය සහ ඨිතස්ස අඤ්ඤථත්ත යනුවෙන් ලක්‍ෂණ තුනකින් යුක්ත වන බව පවසයි. සෑම නාම රූප ධර්මයක් ම පවතිනුයේ එක් ක්‍ෂණයක තුළ පමණක් වන අතර එය උත්පාදක්‍ෂණය, ඨිතික්‍ෂණය හා භංගක්‍ෂණය යනුවෙන් අදියර තුනකින් සමන්විත වෙයි. පළමු අදියරේ දී යම් නාම හෝ රූප ධර්මයක් ඉපිද දෙවන අදියරේ දී පැවතී තෙවන අදියරේ දී අභාවයට පත් වෙයි.

අප ඉහතින් සඳහන් කළ පරිදි අංගුත්තර නිකායෙහි දැක්වෙන සංඛත ලක්‍ෂණ තුන පිළිබඳ ව විග්‍රහ කරන මනෝරථපූරණී අට්ඨකථාව උප්පාද යන්නෙන් ඉපදීමත් වය යන්නෙන් භේදයත් ඨිතස්ස අඤ්ඤථත්ත යන්නෙන් ජරතාවත් අදහස් කරන බව පෙන්වා දෙයි. එමෙන් ම එමගින් උත්පාද ක්‍ෂණය, භංග ක්‍ෂණය හා ඨිති ක්‍ෂණය නියෝජනය වන බව ද සඳහන් කරයි. අප පැවැත්ම ලෙස සඳහන් කරන සියල්ල මෙම ක්‍ෂණභංගුරත්වයට ඇසිල්ලක් පාසා ම ලක් වේ. ක්‍ෂණභංගුරත්වය තුළ රූප ධර්මයන්ගේ ආයු කාලය නාම ධර්මයන්ගේ ආයු කලයට වඩා දීර්ඝ වෙයි. උප්පාද ඨිති භංග වශයෙන් ක්‍ෂණ තුනක් එක් චිත්තක්‍ෂණයක් වන අතර රූප ධර්මයක ආයු කාලය චිත්තක්‍ෂණ දාහතක් බව අභිධම්මත්ථසංගහය පවසයි. විභංගට්ඨකථාව රූප ධර්මයක ආයු කාලය චිත්තක්‍ෂණ හතළිස් නවයන් බව සඳහන් කරයි. විසුද්ධිමාර්ගයේ ද බුද්ධඝෝෂ හිමියෝ බෞද්ධ ක්‍ෂණවාදය 'ඛණපරිත්තතෝ' යනුවෙන් විස්තර කරති.

බෞද්ධ සම්ප්‍රදාය විසින් ඉදිරිපත් කෙරෙන මෙම ක්‍ෂණ භංගුරත්වය යම් පමණකට ගැටලුකාරී තත්ත්වයක් ඇති කරයි. එනම්, ක්‍ෂණභංගුරත්වය හේතුවෙන් ඈතට මේසය ලෙසට පෙනුන දෙය ළඟට ගොස් බැලීමේ දී විනාශ (වය/භංග) වී ඇත්නම් සමස්ත ලෝක ඥාන පද්ධතිය ම කඩා වැටෙයි. ඒ එක් ක්‍ෂණයක හෙවත් උත්පාද ක්‍ෂණයෙහි පැවැති දේ අනෙක් ක්‍ෂණයෙහි හෙවත් භංගක්‍ෂණයෙහි විනාශ වන හෙයිනි.

මෙම ගැටලුකාරී බව නොහොත් බෞද්ධ ක්‍ෂණවාදයෙහි දුරවබෝධ බව හේතුවෙන් ඇතැම් දාර්ශනිකයන් බෞද්ධ ක්‍ෂණවාදය හුදු ප්‍රලාපයකැයි බැහැර කිරීමට පවා පසුබට නො වූ බව බ්‍රහ්ම සූත්‍රයෙන් පැහැදිලි වේ. මෙම කෘතිය වේදාන්ත දර්ශනයෙහි සිළුමිණ ලෙස සලකනු ලබයි. බ්‍රහ්ම සූත්‍රය රචනා කරන ලද බාදරායණ ව්‍යාස ක්‍රිස්තු පූර්ව පස්වන සියවසේ හෝ ක්‍රිස්තු වර්ෂ දෙවන සියවසේ විසූ වේදාන්ත දර්ශනයෙහි ප්‍රමුඛ ආචාර්යවරයෙකි. ඔහු විසින් විරචිත බ්‍රහ්ම සූත්‍ර කෘතිය සූත්‍ර පන්සිය පනස් පහකින් හා පරිච්ඡේද හතරකින් යුක්ත වූවකි. ආරම්භක පරිච්ඡේදය වන 'සමන්වයාධ්‍යාය' තුළින් බ්‍රහ්මන් යනු කවරෙක්දැයි හඳුන්වන ඔහු 'අවිරෝධාධ්‍යාය' නම් දෙවන පරිච්ඡේදයෙන් සාංඛ්‍ය, වෛශේෂික, ජෛන, බෞද්ධ ආදී මත ඛණ්ඩනය කොට වේදාන්ත මතය ප්‍රතිෂ්ඨාපනය කරයි. තුන් වන පරිච්ඡේදය වන ' සාධනාධ්‍යාය' හා සිව් වන පරිච්ඡේදය වන 'ඵලාධ්‍යාය' මගින් වේදාන්තයේ සම්මත වූ සාධන පිළිබඳ විධාන හා සගුණ හා නිර්ගුණ විද්‍යාවන්ගේ කාලය පිළිබඳ විවේචනය කරයි.

මෙහි දී අපගේ අවධානයට ලක් වනුයේ බ්‍රහ්ම සූත්‍රයෙහි 'අවිරෝධාධ්‍යාය' නම් දෙවන පරිච්ඡේදය කෙරෙහි ය. මෙම පරිච්ඡේදයේ දී බාදරායණ විසින් බෞද්ධ ක්‍ෂණවාදය හුදු මායාවක් බවත් එය අතාර්කික මෙන් ම අශාස්ත්‍රීය වූවක් බවත් සනාථ කොට වේදාන්ත දර්ශනය ම සත්‍ය ධර්මය ලෙස ප්‍රතිෂ්ඨාපනය කරනු ලබයි.

## ගැටලුව

බුදුදහම සියලු සංඛත ධර්මයන්හි ද අනිත්‍යතාව අවධාරණය කරන දහමකි. එම අනිත්‍යතා සංකල්පය වඩාත් තීව්‍ර කරමින් පශ්චාත් කාලීන බෞද්ධ සම්ප්‍රදායන් විසින් ඉදිරිපත් කරන ලද ඉගැන්වීම වූයේ ක්‍ෂණවාදය යි. එනම්, සියලු නාම රූප ධර්මයන් මොහොතක් මොහොතක් පාසා ඇතිවෙමින් පැවැතෙමින් හා නැතිවෙමින් ප්‍රවාහයක් සේ විකාශනය වන වීමයි. ක්‍ෂණවාදයට අනුව ක්‍ෂණභංගුරත්වය සිදු වුණ ද අප හා අප අත්දකින ලෝකය එලෙස විනාශ නොවන හෙයින් ක්‍ෂණවාදය හුදු ප්‍රලාපයක් ලෙස බාදරායණ සිය බ්‍රහ්ම සූත්‍රයේ දී එල්ල කරනු ලබන තර්කය පහසුවෙන් බැහැර කළ නොහැකි වෙයි. ඒ අනුව බාදරායණ සිය බ්‍රහ්ම සූත්‍රය තුළින් නිෂ්ප්‍රභ කරන බෞද්ධ ක්‍ෂණවාදය මනෝභ්‍රාන්තියක් ද නො එසේ නම් බාදරායණ එල්ල කරන විවේචන ඛණ්ඩනය කිරීමට බෞද්ධ සම්ප්‍රදායවලට හැකි වූයේ ද යන්න පිළිබඳව විමර්ශනය කිරීමට මෙමගින් අපේක්‍ෂා කෙරේ. එසේ ම මෙම දාර්ශනික කරුණු ප්‍රායෝගිකත්වය හා ගැටේද යන ගැටලුවට ද මෙහිලා පිළිතුරු සැපයේ.

## සෛද්ධාන්තික රාමුව හා පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් ආශ්‍රය කෙරෙන්නේ බාදරායණ කෘත බ්‍රහ්ම සූත්‍රය හා ක්‍ෂණවාදය පිළිබඳ ථේරවාද, සර්වාස්තිවාද හා බෞද්ධ නෛයායික ඉගැන්වීම් ය. උක්ත සම්ප්‍රදායවල ක්‍ෂණවාදය පිළිබඳ ඉගැන්වීම් තුලනාත්මක ව අධ්‍යයනය කොට මූලික පර්යේෂණ ගැටලු ව සඳහා පිළිතුරු හා නිගමන සෙවීමට අපේක්‍ෂා කෙරේ. මෙම අධ්‍යයනය සම්පූර්ණ වශයෙන් ම පුස්තකාල පර්යේෂණයක් ලෙස හඳුන්වා දීම උචිත ය. ඒ අනුව ප්‍රාථමික මූලාශ්‍රය යටතේ ථෙරවාද ත්‍රිපිටකය හා එහි අට්ඨකථාව, විසුද්ධිමාර්ගය, ඥානප්‍රස්ථාන හා ප්‍රමාණවාර්තිකය මෙන් ම  බාදරායණ කෘත බ්‍රහ්ම සූත්‍රය මෙම අධ්‍යයනය සඳහා දායක වේ. මෙම පර්යේෂණයට වක්‍ර ව මෙන් ම ඍජු ව ආලෝකය සපයන ග්‍රන්ථ, ලිපි ලේඛන ද්විතීයික මූලාශ්‍රය ලෙස අදාළ කර ගැණේ. මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් ම ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත මත ම පමණක් පදනම් කර ගනිමින් පර්යේෂණ කාර්යය සිදු කෙරේ.

## සමාලෝචනය

මුල් බුදුසමයේ අවධාරිත අනිත්‍ය සංකල්පයත් ජාති, ජරා, මරණ යන සංකල්පමත් පදනම් කර ගනිමින් පසුකාලීන බෞද්ධ සම්ප්‍රදාය එය ක්‍ෂණවාදයක් දක්වා දියුණු කළේය. සංඛත ධර්ම සියල්ලක් ම එක් ක්‍ෂණයක ඉපිද, පැවතී, නිරුද්ධ වීම හෙවත් අනවරත ක්‍ෂණභංගුරත්වයට පාත්‍ර වෙයි. බෞද්ධ සම්ප්‍රදාය විසින් පිළිගනු ලබන මෙම  ක්‍ෂණභංගුරත්වය හුදු මායාවක් බව බාදරායණ සඳහන් කරයි. ඒ අනුව බෞද්ධ ක්‍ෂණවාදය හා ක්‍ෂණවාදයට එරෙහි ව බාදරායණ එල්ල කරන මත පිළිබඳ ව විමර්ශනාත්මක ව අධ්‍යයනය කොට පිළිගත හැකි තාර්කික නිගමනයකට එළඹීම මෙමගින්  සිදු වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

*අංගුත්තර නිකාය 1.*(1960). (සංස්.)  වජිරඥාන, පරවාහැර නැදිමාල : බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*ඥානප්‍රස්ථාන.* ඤාණසීහ, හේනේපිටගෙදර. (1973). (සංස්.) මරදාන : රත්න පොත් ප්‍රකාශකයෝ.

*ප්‍රමාණවාර්තිකම්.* (1989).  පාණ්ඩේ, රාම චන්ද්‍ර (සංස්.) දිල්ලි : මෝටිලාල්.

*විසුද්ධි මග්ග* (2006). (සංස්.) බුද්ධදත්ත, පමුණුවේ මරදාන : හේවාවිතාරණ මුද්‍රණය.

*සංයුත්තනිකාය* 5-2. (1979).(සංස්.) ලංකානන්ද, ලබුගම නැදිමාලː බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.